# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2088/23 – 2018 සැප්තැම්බර් 10 වැනි සඳුදා – 2018.09.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුගොඩ පල්ලේසිය පත්තුව සුළු කොට්ඨාසයේ, අංක ඊ430සී, කැඳන්ගමුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හැවනතැන්න ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ඒ/එස්ජී/2017/146 හා 2017.06.27 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අංක 1 – හැවනතැන්න වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0375**
උතුරට: සමරකෝන් මුදියන්සේලාගේ රත්නායක හිමිකම් කියන හැවනතැන්න වත්ත සහ ඇළ; නැගෙනහිරට: කැබලි අංක 2; දකුණට: කැබලි අංක 2, ඇළ සහ සමරකෝන් මුදියන්සේලාගේ රත්නායක හිමිකම් කියන හැවනතැන්න වත්ත; බටහිරට: සමරකෝන් මුදියන්සේලාගේ රත්නායක හිමිකම් කියන හැවනතැන්න වත්ත.

02. **කැබලි අංක 2 – ප්‍රමාණය: හෙක්. 0.0111**
උතුරට: කැබලි අංක 1, සමරකෝන් මුදියන්සේලාගේ රත්නායක හිමිකම් කියන හැවනතැන්න වත්ත සහ ඇළ; නැගෙනහිරට: රජය හිමිකම් කියන හැවනතැන්න වත්ත සහ කැබලි අංක 3; දකුණට: කැබලි අංක 3, රජය හිමිකම් කියන හැවනතැන්න වත්ත සහ ඇළ; බටහිරට: සමරකෝන් මුදියන්සේලාගේ රත්නායක හිමිකම් කියන හැවනතැන්න වත්ත සහ කැබලි අංක 1.

03. **කැබලි අංක 3 – හැවනතැන්න වත්ත – ප්‍රමාණය: හෙක්. 0.9949**
උතුරට සහ නැගෙනහිරට: රජය හිමිකම් කියන හැවනතැන්න වත්ත; දකුණට: රාජපක්ෂ මුදියන්සේලාගේ සුනිල් හිමිකම් කියන හැවනතැන්න වත්ත, කැබලි අංක 4 සහ කුරුණෑගල දිස්ත්‍රික්කය; බටහිරට: කුරුණෑගල දිස්ත්‍රික්කය, රජය හිමිකම් කියන හැවනතැන්න වත්ත, ඇළ, කැබලි අංක 2 සහ ඇළ.

04. **කැබලි අංක 4 – හැවනතැන්න වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0338**
උතුරට: කැබලි අංක 3 සහ රජය හිමිකම් කියන හැවනතැන්න වත්ත; නැගෙනහිරට: රාජපක්ෂ මුදියන්සේලාගේ සුනිල් හිමිකම් කියන හැවනතැන්න වත්ත; දකුණට: රාජපක්ෂ මුදියන්සේලාගේ සුනිල් හිමිකම් කියන හැවනතැන්න වත්ත සහ කුරුණෑගල දිස්ත්‍රික්කය; බටහිරට: කුරුණෑගල දිස්ත්‍රික්කය.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

යොමු අංකය: 4-3/7/2016/එච්ඩබ්ලිව්/309.
2018 අගෝස්තු මස 02 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

09 - 664